# දහම් පාසල් අවසාන විභාගය පසුගිය ප්‍රශ්න

## බුද්ධ ධර්මය හා පාලි භාෂා පරිචය

## 03 වන පාඩම; ත්‍රි ලක්ෂණය

### [[ 2020/2021/2022/2023 ]] 03 වන ප්‍රශ්නය

I ත්‍රි ලක්ෂණය පිළිවෙළින් නම් කරන්න.
II ත්‍රි ලක්ෂණයන්ගෙන් දෙකක් හඳුන්වා දෙන්න.
III අ) ස්කන්ධ පංචකය දක්වන්න.
ආ) 'උප්පාද', 'වය' යන පද දෙකෙහි අර්ථය සඳහන් කරන්න.
IV ලෝකය පිළිබඳ යථාවබෝධය සඳහා මෙම ලක්ෂණ ඉවහල් කරගත හැකි අයුරු ලියා දක්වන්න.

### [[ 2019/2020 ]] 02 වන ප්‍රශ්නය

I සියළු සංස්කාර අනිත්‍යයි,සියළු සංස්කාර දුක්ඛයි,සියළු සංස්කාර අනාත්මයි.ඉහත දේශනාවට අදාළ පාලි පාඨය ලියන්න.
II "සංස්කාර" යන පදය හඳුන්වාදී සංස්කාර ගණයට අයත් වන දේ හා අයත් නොවන දේ මොනවාදැයි පෙන්වා දෙන්න.
III සංස්කාර ධර්ම බෙදෙන කොටස්(ස්කන්ධ) පහ නම් කර, මේවායේ එකම ලක්ෂණය කවරේදැයි පෙන්වා දෙන්න.
IV සංස්කාර ධර්මයන්ගේ මනා අවබෝධයක් ඇති කර ගැනීම නිසා නිවන් මග ඉතා ඉක්මණින් අවබෝධ කරගත් බව චූල්ලපන්ථක,නන්ද,ඛේමා,කිසාගෝතමී යන චරිතවලින් අනාවරණය වේ.එම චරිතවලටද අදාළ වූ සිදුවීම් වෙන වෙනම ගෙනහැර දක්වන්න.

### [[ 2018/2019 ]] 03 වන ප්‍රශ්නය

I නිර්වාණ මාර්ගයේදී විශේෂයෙන් අවබෝධ කරගත යුතු ලක්ෂණත්‍රය නම් කරන්න.
II ඒවායින් දෙකක ස්වාභාවය හඳුන්වා දෙන්න.
III මෙම ලක්ෂණත්‍රයට අයත් භාවනා මාර්ගය හඳුන්වන නම ලියා එය බෞද්ධ භාවනාවක් ලෙසින් දක්වා ඇත්තේ කවර හේතු නිසා දැයි පැහැදිලි කරන්න.
IV සත්ත්වයා හා ලෝකය පිළිබඳ යථා ස්වභාවය අවබෝධ කර ගැනීමට මේ ලක්ෂණ හේතුවන අයුරු දක්වන්න.

තිලක් සම්පත් පොඩිබෝරලේගේ

## [[ 2017/2018 ]] 03 වන ප්‍රශ්නය

I ත්‍රි ලක්ෂණයේදී සියළු ධර්ම බෙදන කොටස් දෙක නම් කරන්න.

II එම කොටස් ගැන හැඳින්වීමක් කරන්න.

III යමක් අනිත්‍ය ලක්ෂණයෙන් යුක්ත නම්,එහි දුකද ඇත.(යදනිච්චං තං දුක්ඛං) මෙය පැහැදිලි කර්න්න.

IV "අනාත්ම ලක්ෂණ ප්‍රතිවේදය බෞද්ධ ප්‍රතිපදාවේ ශ්‍රේෂ්ඨතම පියවර වේ." මේ පිළිබඳව කරුණු දක්වන්න.

## [[ 2016/2017 ]] 03 වන ප්‍රශ්නය

I ත්‍රි ලක්ෂණය නම් කරන්න.

II ඒවායින් දෙකක් හඳුන්වන්න.

III සංඛත ධර්මයන්ගේ ස්වභාවය හඳුන්වා,ඒවායේ ඇති එකම ලක්ෂණය කවරේදැයි පෙන්වා දෙන්න.

IV "තමා අයත් නොවන්නාක් තමා අයත් ය" යන වැරදි අල්ලා ගැනීම නිසා පුද්ගලයා මංමුළාවට පත්ව ඇත.මෙහි සත්‍යතාව පහදන්න.

## [[ 2015/2016 ]] 03 වන ප්‍රශ්නය

I ස්කන්ධ පංචකය නම් කරන්න.

II එහි ස්වභාවය කෙටියෙන් පහදන්න.

III ලෝකය හා සත්ත්වයා නිර්මාණය කළැයි සැළකෙන නිර්මාතෘවරුන් දෙදෙනෙකු නම් කර,බුදුසමය නිත්‍ය අවිනශ්වර කිසිවක් නොපිළිගැනීමේ හේතුව පැහැදිලි කරන්න.

IV ත්‍රි ලක්ෂණය පිළිබඳ අවබෝධය දෛනික ජීවිතය සහනයෙන්,සතුටෙන් ගත කිරීමටත් අවසාන වශයෙන් නිවන් අවබෝධයටත් මග පාදා දෙයි.විස්තර කරන්න.

## [[ 2014/2015 ]] 03 වන ප්‍රශ්නය

I අනිත්‍ය,දුක්ඛ,අනාත්ම යන මේ ධර්ම පදයන්ගේ විරුද්ධාර්ථ පද දක්වන්න.

II ත්‍රි ලක්ෂණය මඟින් විශේෂයෙන් අවබෝධ කරගත යුතු මාර්ගය කවරේදැයි පෙන්වා දෙන්න.

III එකී මාර්ගයට පාදකවන බෞද්ධ භාවනාවේ නම දක්වා,ත්‍රි ලක්ෂණාවබෝධය ලබා ගත් පුද්ගලයා ලබා ගැනීමට උත්සහ කරන ඥාණ තුන නම් කරන්න.

IV පුද්ගල හා සමාජ ගැටුම්කාරී ස්වභාවයන් අවම කර ගැනීමට ත්‍රි ලක්ෂණය උපයෝගී කරගත හැකි ආකාරය පහදා දෙන්න.

## [[ 2013/2014 ]]  04 වන ප්‍රශ්නය

I ත්‍රි ලක්ෂණයෙන් නිත්‍ය,ස්ථිර,සදාකාලික යමක් ලොව නැති බව පෙන්වා දෙන ලක්ෂණය නම් කරන්න.

II එම ලක්ෂණයන්ගෙන් දෙකක් හඳුන්වා දෙන්න.

III සංඛත (සසංකාර) ධර්මයන් බෙදෙන ස්කන්ධ පංචකය දක්වා, ඒවායේ ඇති එකම ලක්ෂණය කවරේදැයි පෙන්වා දෙන්න.

IV “ත්‍රි ලක්ෂණය පිළිබඳ අවබෝධය ඇතිකර ගැනීම දුකින් මිදීමට පමනක් නොව, එදිනෙදා ජීවිතය මනාව පවත්වාගෙන යාමටද අනුබලයක් දෙයි.” පැහැදිලි කරන්න.

## [[ 2012/2013 ]]  02 වන ප්‍රශ්නය

I ත්‍රි ලක්ෂණය නම් කරන්න.

II එම ත්‍රි ලක්ෂණයේදී සියලු ධර්මයන් බෙදෙන කොටස් දෙක නම් කරන්න.

III “සියළු සංස්කාර ධර්ම අනිත්‍යයහ.” පහදන්න.

IV ත්‍රි ලක්ෂණය භාවනාවක් වන අයුරු පැහැදිලි කරන්න.

## [[ 2010/2011 ]]  01 වන ප්‍රශ්නය

I ත්‍රි ලක්ෂණය නම් කරන්න.

II එම ලක්ෂණයන්ගෙන් දෙකක් හඳුන්වන්න.

III සියලු සංඛත ධර්ම බෙදී යන කොටස්(කන්ධ ) පහ නම් කර එම ධර්මයන්ගේ ලක්ෂණය වන ‘උප්පාද’, වයධම්මිනෝ’ යන පදයන්හී අර්ථය දක්වන්න.

IV දුකින් මිදීමට පමනක් නොව,එදිනෙදා ජීවිත පැවත්ම සඳහාද මෙම ත්‍රි ලක්ෂණය සම්බන්ධ කරගත හැකි බව පෙන්වා දෙන්න.

## [[ 2009/2010 ]]  02 වන ප්‍රශ්නය

I සියළු සංස්කාර අනිත්‍යයය,සියළු සංස්කාර දුකය, සියළු සංස්කාර ධර්ම අනාත්මයි. මෙයට අදාළ පාලි දේශනා පාඨය ලියන්න.

II සියළු ධර්මයන් බෙදා ඇති කොටස් දෙක දක්වා, ඒවායින් නිවන අයත් වන්නේ කවර කොටසටදැයි දක්වන්න.

III සංස්කාර යනු කවරේදැයි හඳුන්වා එහි පොදු ලක්ෂණය හා එකම ලක්ෂණය කවරේදැයි දක්වන්න.

IV නිර්වාණගාමි මාර්ගයේදී ත්‍රි ලක්ෂණය විශේෂයෙන් අවබෝධ කළ යුත්තේ ඇයිදැයි පැහැදිලි කරන්න.

[[ 2007/2008 ]]     03 වන ප්‍රශ්නය

I ත්‍රි ලක්ෂණය පිළිවෙළින් නම් කරන්න.

II එම ලක්ෂණයන්ගෙන් දෙකක් නම් කරන්න.

III ‘සංඛත’ ධර්මයන් යනු කවරේදැයි හඳුන්වා, එම ධර්මයන් බෙදෙන ස්කන්ධ පහ නම් කර,ඒවායේ එකම ස්වභාවය කෙබඳු දැයි දක්වන්න.

IV ලෝකය පිළිබඳව යථාවබෝධය ඇති කර ගැනීමට මෙම ලක්ෂණය ඉවහල් කරගත හැකි අයුරු පෙන්වා දෙන්න.

[[[[[  2005 ]]]]]     03 වන ප්‍රශ්නය

I ත්‍රි ලක්ෂණයේදී සියළු ධර්මයන් බෙදෙන කොටස් දෙක නම් කරන්න.

II එම කොටස් ගැන හැඳින්වීමක් කරන්න.

III යමක් අනිත්‍ය ලක්ෂණයෙන් යුක්ත නම් එහි දුකද(යද නිච්චං තං දුක්ඛං) ඇත.පැහැදිලි කරන්න.

IV “අනාත්ම ලක්ෂණ ප්‍රතිවේදය බෞද්ධ ප්‍රතිපදාවේ ශ්‍රේෂ්ඨතම පියවර වේ.” මේ ගැන අදහස් ගෙනහැර දක්වන්න.

[[[[[  2004 ]]]]]     04 වන ප්‍රශ්නය

I ත්‍රි ලක්ෂණය නම් කරන්න.

II එම ලක්ෂණවලින් දෙකක් විස්තර කරන්න.

III ත්‍රි ලක්ෂණය ධර්මාවබෝධයෙන් මමත්ත්වය නැතිකරගත හැකි අයුරු පැහැදිලි කරන්න.

IV දුකින් මිදීමට පමනක් නොව එදිනෙදා ජීවිතය යහපත් කර ගැනීමටද ත්‍රිලක්ෂණය භාවිතා කළ හැකි අයුරු පහදන්න.

[[[[[ 2001 ]]]]]     01 වන ප්‍රශ්නය

I ත්‍රි ලක්ෂණය නම් කරන්න.

II ඒවායින් එකක් විස්තර කරන්න.

III “සියළු සංස්කාර ධර්මයෝ අනිත්‍යයහ” පහදන්න.

IV ත්‍රි ලක්ෂණය භාවනාවක් වන අයුරු පැහැදිලි කරන්න.